රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2019

මගේ අංකය: EST-3/POLIC/04/0035
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.08.20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**කල්තබන ලද මැතිවරණ/ ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයන්ට සහන සැලසීම**

මැතිවරණයක්/ඡන්ද විමසීමක් සඳහා ඉදිරිපත් වීමට වැටුප් රහිත නිවාඩු ලබා සිටින දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ට එකී මැතිවරණය/ඡන්ද විමසීම කල් තබන ලද අවස්ථාවලදී පහත සඳහන් අනුග්‍රහ ලබාදීමට 2019.07.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තියේ 2:3:2:1 වගන්තියට පසුව පහත සඳහන් උප වගන්ති ඇතුළත් කර සංශෝධනය කෙරේ.

2:3:2:2 මැතිවරණයක්/ඡන්ද විමසීමක් පැවැත්වෙන දිනය තීරණය කර නාමයෝජනා පිළිගැනීමෙන් පසු අධිකරණ නියෝගයක් මත හෝ හදිසි ආපදා තත්ත්වයක් හේතුවෙන් හෝ මැතිවරණය/ඡන්ද විමසීම කල් දමන අවස්ථාවකදී

(I) නාමයෝජනා භාරගන්නා අවසන් දිනයේ සිට මාස 03ක කාල සීමාව තුළ නව මැතිවරණ/ඡන්ද විමසීමේ දිනය ප්‍රකාශ කරන අවස්ථාවක, මැතිවරණය/ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල නිකුත් කරන දිනය දක්වා වූ මුළු කාල සීමාව වැටුප් රහිත නිවාඩු සේ සැලකිය යුතුය.

(II) නාමයෝජනා භාරගන්නා අවසන් දිනයේ සිට මාස 03ක කාල සීමාව අවසන් දින වන විට ද මැතිවරණය/ඡන්ද විමසීම පැවැත්වෙන නව දිනයක් ප්‍රකාශ නොකරන අවස්ථාවකදී, ඊට පසු දින සිට තේරීම්භාර නිලධරයා විසින් මැතිවරණය/ ඡන්ද විමසීමේ නව දිනය ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශ කරන දිනය තෙක්, අපේක්ෂකයන් වීම නිසා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන සිටින රජයේ නිලධරයන්ට සේවයට වාර්තා කිරීමට අවස්ථාව ලබාදිය යුතුය. තවද, මෙම කාල සීමාව තුළද කාර්යාලීය වේලාව තුළ ස්වකීය සේවා නියුක්තිය ප්‍රයෝජනයට ගනිමින් දේශපාලන පක්ෂවල කාර්යයන්වල හෝ දේශපාලන ප්‍රචාරණ, ප්‍රවර්ධන කාර්යයන්වල හෝ නිරත නොවෙමින් කටයුතු කරන බවට එම නිලධරයන්ගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත යුතුය.

(III) අධිකරණය විසින් තීන්දුවක් ලබාදීමත්/හදිසි ආපදා තත්ත්වය සමනය වීමත් සමඟ තේරීම්භාර නිලධරයා විසින් මැතිවරණය/ඡන්ද විමසීම සඳහා දින නියම කළ දින සිට එම මැතිවරණය/ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල නිකුත් කරන දිනය දක්වා වූ කාල සීමාව නැවත වැටුප් රහිත නිවාඩු කාලයක් ලෙස සැලකිය යුතුය.

2:3:2:3 මැතිවරණයක්/ඡන්ද විමසීමක් පැවැත්වෙන දිනය තීරණය කර නාම යෝජනා පිළිගැනීමට පෙර අධිකරණ නියෝගයක් මත හෝ හදිසි ආපදා තත්ත්වයක් හේතුවෙන් හෝ මැතිවරණය/ඡන්ද විමසීම කල් දමන අවස්ථාවකදී.

(I) මැතිවරණය/ඡන්ද විමසීම කල් දැමීමේ නිවේදනය නිකුත් කරන දින වන විට වැටුප් රහිත නිවාඩු අනුමත කර ඇති නිලධරයන් එකී දිනට පසු දින සිට තමා අවසන් වරට සේවය කළ සේවා ස්ථානයට වාර්තා කළ යුතුවේ.


(II) නැවත මැතිවරණය/ඡන්ද විමසීම පැවැත්වෙන දිනය නිවේදනය කළ පසු ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තියෙහි විධිවිධාන පරිදි ක්‍රියා කළ යුතුවේ.

2:3:2:4 මැතිවරණයක්/ඡන්ද විමසීමක් සඳහා නාමයෝජනා පත්‍ර භාර දී එම නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වූ අවස්ථාවකදී, එසේ ප්‍රතික්ෂේප වූ බව නිවේදනය කරන දින වන විට වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධරයන් එකී දිනට පසු දින සිට තමා අවසන් වරට සේවය කළ සේවා ස්ථානයට වාර්තා කළ යුතුය.

2:3:2:5 මැතිවරණයක්/ඡන්ද විමසීමක් පවත්වා විශේෂිත හේතු මත එම මැතිවරණය/ඡන්ද වීමසීම අවලංගු කරන අවස්ථාවකදී, එසේ අවලංගු කිරීමේ නිවේදනය නිකුත් කළ දින සිට නැවත මැතිවරණය/ඡන්ද විමසීම පැවැත්වෙන දිනය නිවේදනය කරන දිනය දක්වා කාලය මාස 03 ඉක්මවන්නේ නම්, මැතිවරණ/ඡන්ද විමසීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා සිටින රජයේ නිලධරයන්ට, එම මාස 03 ඉක්මවන දින සිට මැතිවරණය/ඡන්ද විමසීම නැවත පැවැත්වෙන දිනය නිවේදනය කරන දින දක්වා කාලය තුළ සේවයට වාර්තා කිරීමට ඉඩදිය යුතුය.

2:3:2:6 ඉහත 2:3:2:2 සිට 2:3:2:5 දක්වා උප වගන්තිවල සඳහන් වැටුප් රහිත නිවාඩු කාලයන් සඳහා නිලධරයන්ට හිමි සාමාන්‍ය නිවාඩු වේ නම් ඒවා ලබා ගැනීමට ඉඩදිය හැකිය.

03. මෙම විධිවිධාන 2019.07.19 දින සිට ක්‍රියාත්මක වේ.



ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය